**මීගහකිවුල ප්‍රාදේශීය සභාව - 2023**
**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

### 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ධාරිතා සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මත ප්‍රාදේශීය සභාවට ලබාදී තිබුණු ටැබ් පරිගණකයේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | ටැබ් පරිගණකයේ වටිනාකම පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලබාදී නොමැති බව. | වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ අරමුදල් යටතේ වැඩ නිම කර තිබුණු ඉදිකිරීම් කර්මාන්ත 02 ක එකතු වටිනාකම රු.2,644,033 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී ගිණුම් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | රාජ්‍ය බැංකුවක පවත්වා තිබුණු ස්ථාවර තැන්පතුවක් සඳහා ඉකුත් වර්ෂයට අදාළව ලැබී තිබුණු බැංකු පොලී ආදායම රු.73,071 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | 2024 වර්ෂයේදී අවශ්‍ය සංශෝධන සිදු කරන බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.67,835 ක් හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදිව ගිණුම් පිළියෙල කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,542,877 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.1,570,375 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුවසමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2023** | | | | **2022** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **ආදායම් ප්‍රභවය** | **ඇස්ත මේන්තුගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්ත මේන්තුගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,703,800 | 1,849,781 | 1,339,772 | 510,009 | 2,400,000 | 1,545,281 | 1,266,784 | 278,497 |
| (ii) | කුලී | 5,161,400 | 4,479,220 | 4,228,470 | 250,750 | 4,419,300 | 4,139,820 | 3,805,664 | 334,156 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 750,000 | 400,524 | 399,275 | 1,249 | 700,000 | 336,694 | 336,694 | 0 |
| (iv) | වෙනත් ආදායම් | 3,947,498 | 3,244,964 | 2,920,809 | 324,155 | 3,243,000 | 2,137,559 | 2,137,559 | 0 |
| | **එකතුව** | **12,562,698** | **9,974,489** | **8,888,326** | **1,086,163** | **10,762,300** | **8,159,354** | **7,546,701** | **612,653** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 05 කට අධික කාලයක සිට පැවත එන හිඟහිටි ජල ගාස්තු රු.342,539 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. | හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අය කර ගත යුතුය. |
| (ආ) | වසර 05 කට අධික කාලයක සිට පැවත එන හිඟහිටි කඩ කාමර කුලී රු.831,043 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. | කඩ කුලී ලේඛනය යාවත්කාලීන නොවීම හේතුවෙන් හිඟය නිශ්චිතව පෙන්වාදිය නොහැකි බව. | හිඟ ආදායම් අය කර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.791,673 ක් හා මුද්දර ගාස්තු රු.1,331,193 ක් ගෙන්වාගෙන නොතිබුණි. | මුද්දර ගාස්තු රු.444,551 ක් ලැබී ඇති අතර, තව දුරටත් හිඟය රු.1,331,193 ක් සහ උසාවි දඩ ලබාගැනීමට සිහි කැඳවීම් ලිපි යොමු කර ඇති බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | 2023 මාර්තු 01 දින සභාවට අයත් බැකෝ ලෝඩර් යන්ත්‍රය සභාවේ වාහන අංගනයේ ගාල්කර තිබියදී බැටරිය අස්ථානගතවීම සම්බන්ධ මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පරීක්ෂණය 2023 දෙසැම්බර් 31 දින වනවිටත් සිදුකර නොතිබුණි. | 2023.04.19 දින ප්‍රාරම්භක වාර්තාව පළාත් පාලනයට යොමු කර ඇති බව. | විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිවයුතු පුද්ගලයන් හඳුනාගෙන අලාභය අයකරගත යුතුය. |
| (ආ) | රාජකාරියට වාර්තා නොකළ සේවකයෙකුට පැමිණීම තහවුරු කර නොගෙන 2023 ඔක්තෝබර් සහ නොවැම්බර් මාස 02 ක් සඳහා වැටුප් වශයෙන් රු.51,000 ක් ගෙවා තිබුණි. | අදාළ නිලධාරියා සම්බන්ධව හේතු විමසා ලිපි යොමු කර ඇති බව. | විධිමත් සේවක කළමනාකරණයක් පවත්වා ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ මැයි 09 දින කොළඹ ප්‍රදේශයේ ඇති වී තිබුණු නොසන්සුන්කාරී වාතාවරණය හේතුවෙන් ගිනි තබා විනාශ කර තිබුණු රු.7,650,000 ක් වූ කැබ් රථය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) අනුව පරීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. | 2023.09.07 දින සභා ලේකම්ගෙන් සහ රියදුරුගෙන් ප්‍රකාශ ලබාගෙන ඇති බව. | පරීක්ෂණ කටයුතු සිදුකර හානියේ වටිනාකම අදාළ පාර්ශවයන්ගෙන් අයකරගත යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේදී පුරනැගුම ව්‍යාපෘතියේ අරමුදලින් රු.17,870,885 ක් වැය කර ඉදි කර තිබුණු මීගහකිවුල නව බස් නැවතුම්පොළ කඩ කාමර 10 ක් 2022 වර්ෂයේදී ගිවිසුම්වලට එළඹ බදුදී තිබුණද 2023 දෙසැම්බර් 31 දක්වාම බදු කුලී අයකරගෙන නොතිබුණි. | විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ බදු දී ඇති බව. | බදු දී තිබුණු දේපළවල බදු කුලී අයකරගත යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බස් නැවතුම්පළ භූමියට බස් රථ වලට ප්‍රවේශවීමට සහ පහසුවෙන් බැහැර වීමට ප්‍රමාණවත් මාර්ගයක් නොමැතිව හා අයිතිය නිරවුල් කර නොගෙන 2017 වර්ෂයේදී පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.33,525,428 ක් වැය කර කඩ කාමර 10කින් යුක්ත උඩුමහලක් සහිතව ඉදිකළ ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පැවතුණි. | එම ස්ථානය බස් නැවතුම්පළ ලෙස භාවිතා නොකළද පොදු කටයුතු වෙනුවෙන් භාවිතා කරන බව. | ඉදිකිරීම් වලට පෙර විධිමත් සැලසුම් සකස් කර දේපළ පවරා ගත යුතුය. |